ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

**Sri Jayawardenapura Education zone**

දෙවන වාර පරීක්ෂණය 2019 | 13 ශ්‍රේණිය

**Second Term Test 2019** | **Grade I**

බෞද්ධ ශිෂ්ටාචාරය i | පැය 2.00

**Buddhist Civilization I** | **2.00 hrs**

සැ.යු. 1. සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
2. අංක 1 සිට 50 තෙක් ප්‍රශ්නවල දී ඇති (1,2,3,4,5) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න. සපයා ඇති පිළිතුරු පත්‍රයේ ප්‍රශ්න අංකයට අදාළ පිළිතුරු අංකයට දී ඇති වරහන තුළ (✖) යොදන්න.
3. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 100 කි.

---

01. වර්ණ ධර්ම මගින් මානව සම්පත් සංවර්ධනය මත උත්පත්තියෙන් ම වටිනාකම් පද්ධතියක් ආරෝපණය වන බව දක්වන හින්දු බැතිමතුන් එය සමාජයේ යහපැවැත්මට අතිශය හිතකර බව ද දැක්වූහ. බ්‍රාහ්මණයන් වර්ණ ධර්මය හිතකර බව දැක්වූ තර්ක අතරට අයත් නොවන සංකල්පය වන්නේ,

(1) වර්ණ ධර්මය තුළින් සමාජයේ සේවාවන් උත්පත්තියෙන් ම පැවරීම මගින් එම කාර්යය මැනවින් පවත්වා ගන්නට හැකිය.
(2) වෘත්තිය විෂයෙහි ශිල්පීය ප්‍රාගුණ්‍යය වර්ධනය කරන්නට හැකිය.
(3) පරම්පරාවෙන් පරම්පරාවට දැනුම ලබා දීමට හැකිය.
(4) සමාජයේ කටයුතු අර්බුදයකින් තොරව මැනවින් පවත්වා ගත හැකිය.
(5) උසස් කාර්යභාරයක් උරුම සමාජ කොටස්වලට සමාජයේ වැඩි වරප්‍රසාද හිමි වෙයි.

02. බමුණෝ දිනකට දෙවරක් ඉතා අළුයමත් සවස් වූ පසුවත් යන අවස්ථා දෙකෙහි ම ස්නානය කිරීම මගින් පව්සෝදා හැරීම සිදු කරති. බ්‍රහ්මණ ආගමේ එන මෙම ඉගැන්වීම,

(1) ආශ්‍රම ධර්මයයි. (2) යාගයයි. (3) උදක පාරිශුද්ධියයි.
(4) උපනයනයයි. (5) ත්‍රිවේදයයි.

03. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව සාමාන්‍ය ජනතාව සඳහා එක් යාග ක්‍රමයකුත් ප්‍රභූන් සඳහා තවත් යාග ක්‍රමයකුත් රාජ්‍ය වංශිකයන් සඳහා වෙනමම යාග කිරීමේ ක්‍රමයකුත් පැවතුණි. රාජ්‍ය වංශිකයන් සඳහා වෙන් වූ යාග අතර එන "සේදුතුමනී යාගය" යන්නෙන් අදහස් කළේ,

(1) රජවරු අභිෂේක කිරීම සඳහා කරන යාගයයි. (2) කුලහීන පිරිමින් බිලි දී කරන යාගයයි.
(3) මද්‍යපාන වර්ග පිළිගන්වමින් කරන යාගයයි. (4) යාග ස්ථම්භය ගව ලෙයින් නහවමින් කරන යාගයයි.
(5) වටිනා අශ්වයින් බිලි දෙමින් කරන යාගයයි.

04. බුදුන් වහන්සේ ශාසනය ගොඩනැගීමේ දී වර්ණ භේදයකින් තොරව සිව් කුලයේ ම අය සමානාත්මතාවයෙන් යුතුව පැවිදි කරගත්හ. ශුද්‍ර කුලයෙන් පැවිදි වූවන්ට උදාහරණයක් වන්නේ,

(1) සැරියුත්, මුගලන් (2) ආනන්ද, නන්ද (3) රාහුල, චක්ඛුපාල
(4) සුනීත, සෝපාක (5) මහාකාල, චුලකාල

05. බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළින් අන්ත අසරණ තත්ත්වයට පත් භාරතීය කාන්තාවට අධ්‍යාපනික, ආගමික, දේශපාලනික, ආර්ථික හා සාමාජික යන සියලු වරප්‍රසාද බුදු දහම තුළින් හිමිවෙයි. එහි දී අධ්‍යාත්මික විමුක්තිය සඳහා ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව තහවුරු වන්නේ,

(1) මවක් ලෙස ගෞරවණීය තත්වයක් හිමිකර දීමෙනි.
(2) බිරිඳක් ලෙස කාන්තාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමෙනි.
(3) කාන්තාවගේ විචක්ෂණශීලී බව අගය කිරීමෙනි.
(4) ථේරී ගාථාවල දැක්වෙන භික්ෂුණීන්ගේ ප්‍රකාශවලිනි.
(5) ළදැරියක් ලෙස අගේ අයිතිවාසිකම් තහවුරු කිරීමෙනි.

06. බුද්ධකාලීන භාරතීය බ්‍රාහ්මණ හා ශ්‍රමණ සංස්කෘතිය එකිනෙක සැසඳීමේ දී පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) බ්‍රාහ්මණ සංස්කෘතිය දේව නිර්මාණවාදය බැහැර කරන අතර ශ්‍රමණ සංස්කෘතිය එය පිළිගනියි.

(2) බ්‍රාහ්මණ සංස්කෘතිය ආත්මවාදය ප්‍රතික්ෂේප කරන අතර ශ්‍රමණ සංස්කෘතිය එය පිළිගනියි.

(3) බ්‍රාහ්මණ සංස්කෘතිය උපත පදනම් කොටගෙන මිනිස් සමාජය වර්ගීකරණයට ලක් කරයි. ශ්‍රමණ සංස්කෘතිය එය බැහැර කරයි.

(4) බ්‍රාහ්මණ සංස්කෘතිය මෙන්ම ශ්‍රමණ සංස්කෘතිය ද කාන්තා නිදහස අගය කරයි.

(5) බ්‍රාහ්මණ සංස්කෘතිය මෙන්ම ශ්‍රමණ සංස්කෘතිය ද මිනිසාගේ ආගමික නිදහස අගය කරයි.

07. ෂට් ශාස්තෘවරුන් අතරින් සත්වයාගේ ඇතිවීම, පැවතීම හා විනාශය ආදී කුමන කරුණක් අරභයා කිසිදු හේතුවක් ප්‍රත්‍යයක් බල නොපාන බව ප්‍රකාශ කළ ශාස්තෘවරයා වන්නේ,

(1) පූර්ණ කස්සප (2) මක්ඛලි ගෝසාල (3) අජිත කේසකම්බල
(4) පකුධ කච්චායන (5) සංජය බෙල්ලට්ඨපුත්ත

08. බුද්ධ කාලීන භාරතයේ පැවති පාලන තන්ත්‍ර පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) වෛශාලිය අගනගරය කරගත් වජ්ජි රාජ්‍යය ප්‍රබල රාජාණ්ඩුවකි යන්නයි.

(2) රජගහනුවර අගනගරය කරගත් මගධ රාජ්‍යය ගණතන්ත්‍ර පාලනයකි යන්නයි.

(3) කුසිනාරාව අගනගරය කරගත් මල්ල රාජ්‍යය ගණතන්ත්‍ර පාලනයකි යන්නයි.

(4) සාවත්තිය අගනගරය කරගත් කොසොල් රාජ්‍යය කුඩා රාජ්‍යයකි යන්නයි.

(5) උදේනිය අගනගරය කරගත් අවන්ති රාජ්‍යය සමූහාණ්ඩුවකි යන්නයි.

09. ක්‍රි.පූ. හයවැනි සියවසේ භාරතීය සමාජය ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයත් සමග වාණිජකරණයට හා නාගරිකරණයට පත්විය. එහිලා කැපී පෙනෙන ක්‍රියාකාරී පිරිසක් ලෙස සැලකිය හැක්කේ,

(1) රාජ්‍ය නිලධාරීන් ය. (2) සිටුවරුන්ය. (3) කර්මාන්තකරුවන් ය.
(4) ඉඩම් හිමියන් ය. (5) රජවරුන් ය.

10. "ලෝකය හා සත්වයා සර්ව බලධාරී දෙවියෙකු විසින් මවා පාලනය කරනු ලැබේ." යන ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම බැහැර කරන බුදු දහම සමාජ ප්‍රභවය හා විකාශනය පිළිබඳව හේතුඵලවාදී ඉගැන්වීමක් ඉදිරිපත් කරයි. මෙම ඉගැන්වීම දැක්වෙන ප්‍රධානතම සූත්‍රය වන්නේ,

(1) දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයයි. (2) දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රයයි.
(3) මජ්ඣිම නිකායේ අස්සලායන සූත්‍රයයි. (4) මජ්ඣිම නිකායේ වාසෙට්ඨ සූත්‍රයයි.
(5) දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයයි.

11. සමාජයේ විවිධත්වය හා ඒකත්වය පවත්වාගෙන යාම සඳහා මනුෂ්‍ය වර්ගයා වර්ණ චතුෂ්කයකට බෙදා මැවූ බව වෛද ග්‍රන්ථවල දැක් වේ. මෙම ඉගැන්වීම් බ්‍රාහ්මණයන් විසින් විවිධ අභිප්‍රායන් සඵල කර ගැනීම සඳහා යොදාගත් බව ද පෙනේ. ඒ අනුව පහත දැක්වෙන කරුණු අතරින් ඔවුන්ගේ ප්‍රධාන අභිමතාර්ථය වූයේ,

(1) ඉඩම් අයිතිය රැක ගැනීමයි. (2) අධ්‍යාපන අයිතිය රැක ගැනීමයි.
(3) දේශපාලන අයිතිය රැක ගැනීමයි. (4) ආර්ථික අයිතිය රැක ගැනීමයි.
(5) පූජක අයිතිය රැක ගැනීමයි.

12. ජන්මීය සාධකය පදනම් කොට ගෙන බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් මානව වර්ගයා උසස් පහත් වශයෙන් බෙදා වෙන් කොට දක්වනු ලැබීය. බුදු සමය මෙකී වර්ගීකරණය බැහැර කරමින් චතුර් වර්ණය ම සමාන යැයි ද මානව සංහතියේ ඇත්තේ නානාත්වයක් නොව ඒකත්වයක් බව ද පෙනේවා දෙයි. එසේ නමුත් මානව වර්ගයාගේ යම් විවිධත්වයක් දැකිය හැකියැයි ද අවධාරණය කෙරේ. එකී විවිධත්වයට හේතු වන්නේ,

(1) ආචාර විද්‍යාත්මක පදනම මගිනි. (2) ඓතිහාසික පදනම මගිනි.
(3) ජීව විද්‍යාත්මක පදනම මගිනි. (4) සමාජ විද්‍යාත්මක පදනම මගිනි.
(5) ආධ්‍යාත්මික පදනම මගිනි.

13. භාරතීය ආගමික චින්තනය තුළ ක්‍රමිකව විකාශයට පත් වූ ප්‍රධාන ආගමික සම්ප්‍රදා දෙක වූයේ බ්‍රාහ්මණ සම්ප්‍රදාය හා ශ්‍රමණ සම්ප්‍රදායයි. මෙම සම්ප්‍රදා දෙකට අනන්‍ය වූ සුවිශේෂී ලක්ෂණයන්ද දැකගත හැකිය. මෙයින් බ්‍රාහ්මණ සම්ප්‍රදායට අනන්‍ය වූ ලක්ෂණයක් නොවන්නේ,

(1) ව්‍රත සමාදානය වැනි පිළිවෙත් අනුගමනය කිරීමයි.
(2) ජන්මයෙන් උරුම වූ පාරිශුද්ධත්වයක් තිබීමයි.
(3) බ්‍රහ්ම සහව්‍යතාවය පරම සැපත ලෙස පිළිගැනීමයි.
(4) නිර්මාණවාදය පිළිගැනීමයි.
(5) ස්වඡන්දතාවයට ඉඩකඩ නොදීමයි.

14. බුදුන් වහන්සේ වනිතාව වෙත හිමිකර දුන් ස්වාධීනත්වයේ ස්වර්ණමය අවස්ථාව නම් පුරුෂයාට මෙන්ම ස්ත්‍රියටද තම සාසනයේ පැවිදිවීමට ඉඩ සලසා දී සසර කතරින් එතෙරවීමට අවස්ථාව සලසාදීමයි. මේ නිසාම බොහෝ කාන්තාවෝ භික්ෂුණී ශාසනයට ඇතුළත්ව ධර්මය අවබෝධ කොටගෙන ඒ ඒ අංශයන්ගෙන් දක්ෂතාවයන් පෙන්නුම් කොට තනතුරු පවා ලබා ගත්හ. එසේ තනතුරු ලැබූවන් අතරින් දිවැස් ඇත්තියන් අතරින් අග තනතුරු ලැබූ තෙරණිය වූයේ,

(1) සකුලා තෙරණියයි.
(2) භද්දා කාපිලානි තෙරණියයි.
(3) භද්දා කුණ්ඩලකේසී තෙරණියයි.
(4) කිසාගෝතමී තෙරණියයි.
(5) සිඟාල මාතා තෙරණියයි.

15. පුද්ගලයාගේ හා සමාජයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සාකච්ඡා කිරීමේදී ඉතා වැදගත් සූත්‍ර දේශනා ඇතැයි දම් දෙසුමකදී පන්සලේ නායක ස්වාමීන් වහන්සේ දේශනා කළහ. ඒ අතරින් සමාජයෙන් බැහැර කළයුතු තුදුස් ලාමක ධර්ම හා සමාජය වෙතින් ළංකර ගතයුතු දස අලාමක ධර්ම ඇතුළත් සූත්‍ර දේශනයක් ද සිහිපත් කළේය. එම සූත්‍ර දේශනාව වන්නේ,

(1) සිගාලෝවාද සූත්‍රය යි.
(2) පරාභව සූත්‍රය යි.
(3) පත්තකම්ම සූත්‍රය යි.
(4) ධම්මික සූත්‍රය යි.
(5) අග්ගඤ්ඤ සූත්‍රය යි.

16. කිසියම් කාර්යයක් ආරම්භ කර පවත්වාගෙන යාමේදී ඇති කරගත යුතු වීර්යය 6 ක් ආරම්භක ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු, ධිති ධාතු, උපක්කම ධාතු ලෙස බුදුදහමේ දැක්වේ. මෙම අංග සය පුද්ගල ශක්තිය අගයන ධර්මයක් ද වන අතර මෙය ඇතුළත්ව ඇති සූත්‍ර දේශනාව වනුයේ,

(1) කාලාම සූත්‍රය
(2) සිගාලෝවාද සූත්‍රය
(3) මංගල සූත්‍රය
(4) අත්තකාර සූත්‍රය
(5) අග්ගඤ්ඤ සූත්‍රය

17. "ජන සම්මතවාදී පාලනයක සම්ප්‍රදායික මූලධර්ම රැකගනිමින් පාලන කටයුතු සිදු කිරීමෙන් එකී පාලන තන්ත්‍රය පහසුවෙන් බිඳ නොවැටෙන්නේ ය." යනු බුදුසමයේ පිළිගැනීමයි. එවැනි සාරධර්ම පද්ධතියක් ලෙස හැඳින්විය හැක්කේ,

(1) සතර සංග්‍රහ වස්තුවයි.
(2) පංචශීල ප්‍රතිපදාවයි.
(3) සප්ත අපරිහානීය ධර්මයයි.
(4) දසරාජ ධර්මයයි.
(5) දස සක්විතිවත් ය.

18. බුද්ධ දේශනාවට අනුව ආධ්‍යාත්මික විමුක්තිය සඳහා පිළිපන් පුද්ගලයාම ශ්‍රාවක සංඝ ගණයට ඇතුළත් වේ. ශ්‍රාවකයෝ සේඛ ශ්‍රාවක සහ අසේඛ ශ්‍රාවකයෝ වශයෙන් කොටස් දෙකකි. මෙයින් අසේඛ ශ්‍රාවක ගණයට ඇතුළත් වන්නේ,

(1) සෝවාන් ඵලයට පිළිපන් පුද්ගලයාය.
(2) සකෘදාගාමී ඵලයට පිළිපන් පුද්ගලයාය
(3) අනාගාමී මාර්ගයට පිළිපන් පුද්ගලයාය.
(4) අරහත් මාර්ගයට පිළිපන් පුද්ගලයාය.
(5) අරහත් ඵලයට පිළිපන් පුද්ගලයාය.

19. අන්‍යෝන්‍ය ගෞරවය හා සුහදත්වය ගොනැගීම සඳහා ඉවහල් වන සමාජ ධර්ම රාශියක් බුදු සමයෙහි උගන්වා තිබේ. එහිලා උපයෝගී වන ප්‍රමුඛ සමාජ ධර්මයක් ලෙස සැලකිය හැක්කේ,

(1) පණ්ඩිතයන් ඇසුරු කිරීමයි. (2) පරිත්‍යාගශීලී වීමයි. (3) නිතර ධර්මය ඇසීමයි.
(4) ශිල්ප ශාස්ත්‍ර අධ්‍යනය කිරීමයි. (5) විනයානුකූලව ජීවත් වීමයි.

20. යුතුකම් හා වගකීම් පදනම් කොටගෙන සමාජ සම්බන්ධතා ජාලයක් ගොඩනැගෙන බව සිගාලෝවාද සූත්‍රය අවධාරණය කරයි. එහි දැක්වෙන පරිදි ශිෂ්‍යයා විසින් ගුරුවරයා විෂයෙහි ඉටු කළ යුතු යුතුකමක් වන්නේ,

(1) කුදුමහත් කටයුතු කිරීම. (2) යහපතෙහි පිහිටුවීම.
(3) දායාදය ආරක්ෂා කිරීම. (4) ගුණ වර්ණනා කිරීම.
(5) විපතක් වූ කල අත් නොහැරීම

21. තමන්ට වඩා ගුණයෙන්, නුවණින්, වයසින්, වැඩි ගුණගරුක පිරිස් පිදීමට ලක්කිරීම මෙලොව පරලොව සුගතියට හේතුවන කරුණකි. මංගල සූත්‍රයෙහි දී පිදිය යුත්තන් පිදීම උසස් මංගල කරුණක් ලෙස ද දක්වා තිබේ. මෙම ගුණාංගය දස පින්කිරියවත් වල සඳහන් වන්නේ,

(1) පත්තිදාන වශයෙනි. (2) පත්තානුමෝදනා වශයෙනි.
(3) අපචායන වශයෙනි. (4) වෙය්‍යාවච්ච වශයෙනි. (5) දිට්ඨිජු වශයෙනි.

22. බුදුරජාණන් වහන්සේ පිළිබඳව, සම්බුද්ධත්වය පිළිබඳව, බුදුගුණ පිළිබඳව තම සිත තුළ ඇතිකරගන්නා පැහැදීම ශ්‍රද්ධාව ලෙස හඳුන්වයි. බුදු දහම තුළ අගය නොකළ ශ්‍රද්ධාව වන්නේ,

(1) ආගම සද්ධාවයි. (2) අධිගම සද්ධාවයි. (3) සම්ප්‍රසාදන සද්ධාවයි.
(4) අමූලික සද්ධාවයි. (5) ආකාරවතී සද්ධාවයි.

23. "ඇවිළෙන ගිනි කඳකට කෙතරම් දර දැමුවත් සෑහීමක් නොමැත. ඇළ දොළ මගින් කෙතරම් ජලය මුහුදට පැමිණියත් ඇතිවීමක් නොමැත. ආශාවේ සීමාවක් නොදන්න මිනිසාට ගැල් ගණනක් වස්තු එක් වුවත් ප්‍රමාණවත් නොවේ. මේ තත්වය අවබෝධ කරගත් බෞද්ධයා ආශාවන් අඩුකර ගනිමින් තෘප්තිමත් සරල දිවිපෙවෙතකට හුරුවෙයි." ඉහත ඡේදයෙන් ගම්‍යවන බෞද්ධ සදාචාර ධර්මය හැඳින්වීමට වඩාත් සුදුසු වචනය වන්නේ,

(1) මහේච්ඡතාවයි. (2) බහුකිච්චතාවයි. (3) අල්පේච්ඡතාවයි
(4) අල්පකෘත්‍යතාවයි. (5) සුබරතාවයි.

24. "පංචසිඛ" නම් ගාන්ධර්වයා බුදුරදුන් වෙත පැමිණ බේලුව පණ්ඩු වීණාව වාදනය කරමින් සිය පෙම්වතිය වෙනුවෙන් ප්‍රබන්දිත ගී පෙළක් ගායනා කළේය. මෙහිදී බුදුරජාණන් වහන්සේ පංචසිඛගේ ගායන - වාදන දක්ෂතාව ඇගයීමට ලක් කළහ. මෙම සිදුවීම සඳහන් වන්නේ,

(1) මහා මංගල සූත්‍රයේ ය. (2) සක්කපඤ්හ සූත්‍රයේ ය.
(3) සිගාලෝවාද සූත්‍රයේ ය. (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය.
(5) මහා පරිනිබ්බාණ සූත්‍රයේ ය.

25. විවේකය යනුවෙන් හඳුන්වන්නේ වෙන්වීමයි. ගිහියාට මෙන් පැවිද්දාට ද විවේකය අත්‍යවශ්‍ය දෙයකි. බුදු දහමේ විවේකය කාය, චිත්ත, උපධි විවේකය ලෙස අවස්ථා කීපයකින් දක්වා තිබේ. මෙහි එන උපධි විවේකය නම්,

(1) ලෙඩ රෝගවලින් මිදී ලබන විවේකයයි.
(2) මානසික අවුල්වලින් මිදී ලබන විවේකයයි.
(3) නිශ්ශබ්ද පරිසරයක විඳින විවේකයයි.
(4) සියලු ආශාවන්ගෙන් මිදී ලබන විවේකයයි.
(5) වන්දනා ගමන් යාමෙන් ලබන විවේකයයි.

26. "අනණ" සූත්‍රයේ විස්තර වන චතුර්විධ සුඛයන් අතර "අනවජ්ජ සුඛ" යනුවෙන් අදහස් කරන්නේ,

(1) නිවැරදි දිවි පෙවෙතක් තුළින් ලබන සතුටයි.
(2) ණය නැතිකම නිසා ඇතිවන සතුටයි.
(3) පංච ඉන්ද්‍රියන් පිනවීමෙන් ලබන සතුටයි.
(4) තමා උපයන ලද ධනය සම අය වැයක් සහිතව වියදම් කිරීමෙන් ලබන සතුටයි.

(5) දැහැමින් උපයාගත් ධනයක් ඇතැයි සතුටු වීමයි.

27. බුදු දහමට අනුව පුද්ගලයා ධනය ඉපැයිය යුතු වන්නේ වංචනික ලෙස නොව ධාර්මික ලෙස තම ශ්‍රමය යෙදවීමෙනි. මී මැස්සන් මල නොතලා රොන් ගන්නා සේ අනුන්ට කරදරයක් නොකර ධනය සම්පාදනය කළ යුතු බවත් එය වේයන් විසින් බඳිනා තුඹසක් මෙන් වහා වර්ධනය වන බවත් කියවෙන බෞද්ධ සූත්‍ර දේශනාව වන්නේ,

(1) ඉණ සූත්‍රය (2) පත්තකම්ම සූත්‍රය (3) සිගාලෝවාද සූත්‍රය
(4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය (5) අනණ සූත්‍රය

28. සිද්ධාර්ථ මහ බෝසතාණන් වහන්සේ සම්බුද්ධත්වයට පත් වීමේ දී ලැබූ සර්වඥතා ඥානය සමග අෂ්ට විද්‍යා ඥානය උපදවා ගත් බව බුද්ධ චරිතයේ දැක්වේ. එම ඥානයන්ට අයත් වන දිබ්බචක්ඛු ඥානය නම්,

(1) පෙර ආත්ම පිළිබඳ දැනගැනීමේ ඥානයයි.
(2) දෙවියන්ගේ සිත්වල ඇති දේ දැකීමේ ඥානයයි.
(3) මිනිසුන්ගේ සිත්වල ඇති දේ දැකීමේ ඥානයයි.
(4) සත්ත්වයාගේ චුතිය හා උත්පත්තිය දැනගැනීමට ඉවහල් වන ඥානයයි.
(5) ලෝකය යථාර්ථ වශයෙන් දැකගැනීමේ ඥානයයි.

29. බුදුරජාණන් වහන්සේ දෙව්, මිනිසුන්, යක්ෂ, ප්‍රේත, තිරිසන් ආදී සියලු සතුන්ට උතුම් දහමක් කියා දුන් ශාස්තෘවරයන් වහන්සේය. බුදුරජාණන් වහන්සේගේ දේශනා විලාසය ද විශිෂ්ට ශාස්තෘත්වය ප්‍රකට කරන්නකි. දහම් දෙසීමේ දී භාවිත කළ දේශනා විලාස අතර "උපමානුසාරී දේශනා" විලාසයට උදාහරණයක් වන්නේ,

(1) දම්සක් පැවතුම් සූත්‍රය
(2) කන්ධක සූත්‍රය
(3) රාහුලෝවාද සූත්‍රය
(4) අස්සලායන සූත්‍රය
(5) ධනිය සූත්‍රය

30. "උපාලි ගෘහපතිය ඔබ පෙර ජෛන ආගම අදහන විට එම ආගමික පිරිස්හට දානමාන පිදුවේ ය. තෙරුවන් සරණ ගිය බෞද්ධයෙකු වූ පසුවද පෙර චාරිත්‍ර එලෙස ම කරගෙන යන්න" මෙම ප්‍රකාශය තුළින් තහවුරු වන්නේ උන්වහන්සේ තුළ පැවති,

(1) තාදී ගුණයයි.
(2) ආගමික සහනශීලී ගුණයයි.
(3) පුරිසධම්මසාරථී ගුණයයි.
(4) පද්මාකාර ජීවිතයයි.
(5) විශිෂ්ට ශාස්තෘත්වයයි.

31. බ්‍රාහ්මණ සම්ප්‍රදායට විරුද්ධව ගමන් කළ පිරිස ශ්‍රමණයෝ වෙති. ශ්‍රමණ සම්ප්‍රදාය නියෝජනය කළ ආජීවක පිරිස් ක්‍රි.පූ. හයවන සියවසේ ජනප්‍රියතාවක් ලබාගත් පිරිසකි. මොවුනගේ සුවිශේෂී ලක්ෂණයක් වූයේ,

(1) ජීවිතාන්තය දක්වා ව්‍රත අනුගමනය කරමින් ජීවත් වීම.
(2) තැන තැන ඇවිදිමින් මෝක්ෂ ගවේෂණයෙහි නිරත වීම.
(3) නිර්වස්ත්‍රව ගත කිරීම.
(4) ජටා දැරීම.
(5) ශුද්ධ ගංගාවලින් ස්නානය කර පව් සෝදා හැරීම.

32. පස්වග තවුසන් 'ඒහි භික්ඛු පබ්බජ්ජාවෙන්' පැවිදි කිරීමෙන් පළමුවන භික්ෂු පිරිස ඇතිවිය. දෙවන ධර්මදූත පිරිසට අයත් වන්නේ,

(1) යසකුල පුත්‍රයා සහ ඔහුගේ මිතුරන්
(2) තුන්බෑ ජටිලයන්
(3) භද්දවග්ගියේ කුමාරවරු
(4) සුද්දෝවුන් රජුගේ ඇමතිවරු දසදෙනා සහ ඔවුනගේ පිරිස

(5) උපතිස්ස කෝලිත පරිබ්‍රාජකයන් සහ පිරිස

33. 'සියල්ලෝම දඬුවමට තැති ගනිති. සියල්ලෝම මරණයට බිය වෙති. එහෙයින් තමා උපමා කොට අනුන් පීඩාවට ලක් නොකළ යුතුය. නොනැසිය යුතුය.' මෙම උතුම් ඉගැන්වීම අයත් වන්නේ,

(1) අමාවතුරේ ය.
(2) සිගාලෝවාද සූත්‍රයේ ය.
(3) රසවාහිනියේ ය.
(4) ධම්මපදයේ ය.
(5) පූජාවලියේ ය.

34. පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය විෂයෙහි දස කුසල ධර්මයන්හි උපයෝගීතාව පෙන්වා දෙන බුදු දහම, දස පුණ්‍ය ක්‍රියාවන්හි උපයෝගීතාව ද අවධාරණය කරයි. විශේෂයෙන් පුද්ගල සමාජ සංවර්ධනයට බෙහෙවින් බලපාන එම පින් ක්‍රියාවන්වලට අයත් නොවන වගන්තියක් වන්නේ,

(1) දන්දීම යි.
(2) වතාවත් සිදු කිරීම යි.
(3) පිංකම් සිදුකර පිං දීම යි.
(4) ප්‍රිය වචන කථා කිරීම යි.
(5) පිං අනුමෝදන් වීම යි.

35. පින් - පව්, කුසල් - අකුසල් විනිශ්චය කිරීමට අදාළ බෞද්ධ නිර්ණායක විමසීමේ දී "ප්‍රත්‍යවේක්ෂණය" ඉතා වැදගත් වූ නිර්ණායකි. ඒ සඳහා අධ්‍යයනයේ දී වැදගත් වන සූත්‍ර දේශනාව වන්නේ,

(1) රාහුලෝවාද සූත්‍රය යි.
(2) වේළුද්වාර සූත්‍රය යි.
(3) මහාචත්තාරීසක සූත්‍රය යි.
(4) ධම්මික සූත්‍රය යි.
(5) කාලාම සූත්‍රය යි.

36. "අත්තුපනායික ධර්මපර්යාය" කුසල - අකුසල විනිශ්චයේ දී ඉතා වැදගත් බව වේළුද්වාර සූත්‍රයේ සඳහන් වේ. මෙහි "අත්තුපනායක ධර්ම පර්යාය" යනුවෙන් කියැවෙන්නේ,

(1) තමාගේ කැමැත්තට අනුව ක්‍රියා කිරීම යි.
(2) තමා උසස් කොට සැළකීම යි.
(3) තමා උපමා කොට සිතීම යි.
(4) ආත්මවාදීත්වය බැහැර කිරීම යි.
(5) ආත්ම වංචාවෙන් තොර වීම යි.

37. පුද්ගලයා තුළ සැපය ආරක්ෂා වීමට නම් යුතුකම් හා වගකීම් වෙනුවෙන් තම දැහැමි ධනය කැපකළ යුතු බව ගුණසෝම දනී. ඒ අනුව ඔහු විසින් ඉටුකළ යුතුකම් පහක් පිළිබඳව අංගුත්තර නිකායේ පත්තකම්ම සූත්‍ර යේ සඳහන් වේ. එම යුතුකම් අතර "මළගිය අයට පිංදිය යුතුය" යන අදහස ඇතුළත් වර්ණය වන්නේ,

(1) අතිථි බලි යන්න ය.
(2) ඥාති බලි යන්න ය.
(3) දේවතාබලි යන්න ය.
(4) රාජබලි යන්න ය.
(5) පුබ්බපේත බලි යන්න ය.

38. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසුව කිඹුල්වත්පුරයට වැඩි ගමනේ දී නන්ද කුමරු පැවිදි කරගැනීම, රාහුල කුමරු පැවිදි කරගැනීම නිසා කම්පනයටත් දුකටත් පත් වූ සුද්ධෝදන රජු වහා බුදුරදුන් වෙත පැමිණ පැවිදි කිරීම සම්බන්ධයෙන් සීමා පනවන ලෙස වරයක් ඉල්ලා සිටියේ ය. ඒ සීමා නියමය වන්නේ,

(1) අඩු වයසේ කුඩා දරුවන් පැවිදි නොකළ යුතුය. යන්නයි.
(2) දෙමාපිය අවසරය නොලත් දරුවන් පැවිදි නොකළ යුතුය යන්නයි.
(3) රාජකීය පවුල්වල දරුවන් පැවිදි නොකළ යුතුය යන්නයි.
(4) ස්ව කැමැත්ත නොවිමසා කුල දරුවකු පැවිදි නොකළ යුතුය යන්නයි.

(5) ඥාති පවුල්වල දරුවන් පැවිදි නොකළ යුතුය යන්නයි.

39. සාමණේර බවින් ඔසවා තැබීම, මහලු පැවිද්ද, අධිශීලයට පත්වීම යන සියලු වචනවලින් ප්‍රකාශ වන්නේ උපසම්පදාවයි. බුදු දහමේ උපසම්පදා ක්‍රම අටක් පවතියි. ඒ අතුරෙන් "ඤත්තිචතුත්ථකම්ම" උපසම්පදාව යනු,

(1) සරණාගමනය ලබා දී සිදුකරන උපසම්පදාවයි.
(2) දූතයකු මගින් උපසම්පදාව ලබා දීමයි.
(3) ඒක නාම කිං ආදී ප්‍රශ්න අසා ලබාදෙන උපසම්පදාවයි.
(4) උභතෝ සංඝයා ඉදිරියේ කරන උපසම්පදාවයි.
(5) සංඝ සභාවක් රැස් වී ශීල පාරිශුද්ධත්වයෙන් යුතුව කරන උපසම්පදාවයි.

40. පස්වග මහණුන්ගෙන් ආරම්භ වූ බෞද්ධ සංඝ සංවිධානයෙහි විකාශයත් සමග විවිධ පුද්ගලයන් රෝගාබාධවලට උසස් ප්‍රතිකාර ලබා ගැනීම, අසරණ බවින් මිදීම, සුව පහසුවෙන් ජීවත්වීම, සමාජයේ ගරු බුහුමන් ලබා ගැනීම වැනි පෞද්ගලික අවශ්‍යතා ඉටුකර ගැනීමට සසුන්ගත වූ බව විනය පිටකයේ පැහැදිලි වේ. එහෙත් බුදුරදුන්ගේ ඇගයීමට අනුව බෞද්ධ පබ්බජ්ජාවේ මූලික පරමාර්ථය විය යුත්තේ,

(1) සියලු සංසාරික දුකින් මිදීමයි.
(2) මරණින් මතු සුගතිගාමී වීමයි.
(3) කිසිවෙකුට බරක් නොවී පහසුවෙන් ජීවත් වීමයි.
(4) පිණ්ඩපාතයෙන් ලැබෙන දෙයකින් යැපීමයි.
(5) සමූහයක් ලෙස සමගියෙන් ජීවත් වීමයි.

41. වස් එළඹීමේ පහසුව සඳහා පෙරවස් හා පසුවස් ලෙස නියමයන් දෙකක් පවතියි. පෙරවස් සමාදන් විය යුත්තේ,

(1) වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයේ ය.
(2) ඇසළ පුර පසළොස්වක පොහෝ දිනයේ ය.
(3) නිකිණි පොහෝ දිනයේ ය.
(4) නිකිණි පෝය දිනයට පසු දිනයේ ය.
(5) ඇසළ පුර පසළොස්වක පොහෝ දිනයට පසු දිනයේ ය.

42. භික්ෂූන් වහන්සේලාගේ පාරිශුද්ධත්වය සහ සංඝ සාමග්‍රිය අපේක්ෂාවෙන් සිදුකරනු ලබන උපෝසථ විනය කර්මය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) උපෝසථ විනය කර්මය සඳහා ප්‍රමාණවත් උපසපන් භික්ෂූන් පිරිසක් සිටිය යුතුය.
(2) උපෝසථාගාරයට සාමණේර භික්ෂූන් වහන්සේලා සහභාගී කර ගැනීම අනිවාර්ය වේ.
(3) ගිහි පක්ෂයට මේ සඳහා සහභාගී වීමට අවසර නැත.
(4) බෞද්ධ භික්ෂූන්ගේ තිර පැවැත්ම සඳහා තීරණ ගනු ලබන ස්ථානයයි.
(5) උපෝසථාගාරය තුළ භික්ෂූන් රැස්වී ප්‍රාතිමෝක්ෂය දෙසීමට ප්‍රථම ඉටුවිය යුතු චාරිත්‍ර ක්‍රම දෙකක් පවතී.

43. ප්‍රථම ධර්ම සංගායනාවෙන් ලැබූ ප්‍රතිඵල අතර විනය හා සූත්‍ර පිටකයන් සම්පූර්ණවීම සිදු විණි. එමෙන් ම සූත්‍ර පිටකය කොටස් පහකට බෙදා දැක්වූ අතර එය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාණක පරපුරකට ද පවරන ලදී. ඒ අනුව සංයුක්ත නිකායෙහි හිමිකාරිත්වය ලැබූ භාණක පරපුර වූයේ,

(1) ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිස
(2) සැරියුත් තෙරුණුවන්ගේ ශිෂ්‍ය පිරිස
(3) මහා කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිස
(4) අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිස
(5) පොදුවේ සියළු භික්ෂූන් වහන්සේලා

44. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස කාලයක් ගතවත්ම ථෙරවාදී භික්ෂූන් කොටස් දොළහකටත් මහායානික භික්ෂූන් කොටස් හයකටත් වශයෙන් අටළොස් නිකායකට බෙදී පැවතුණි. මෙම බෙදී ගිය පිරිස් අතුරින් ථේරවාදී සම්ප්‍රදායට අයත් නොවන පිරිස වනුයේ,

(1) ස්ථවිරවාදීන් (2) මහිංසාසක
(3) ධර්මගුප්තික (4) ඒකබ්බෝහාරික

(5) ඡන්තාගාරික

45. භාරතයේ බෞද්ධ විශ්වවිද්‍යාල අතර රාමවතී නුවරට ආසන්නව ආරම්භ කරන ලද, තන්ත්‍රයාන බුදු දහම ප්‍රචාරය කරන ප්‍රධානතම අධ්‍යාපන මධ්‍යස්ථානයක්ව පැවති, ශ්‍රී විභූතිචන්ද්‍ර හිමියන් කුලපති තනතුර දැරූ විශ්වවිද්‍යාලය වූයේ,

(1) ජගද්දලා විශ්වවිද්‍යාලය
(2) සෝමපුර විශ්වවිද්‍යාලය
(3) වලභි විශ්වවිද්‍යාලය
(4) ඕදන්තපුරී විශ්වවිද්‍යාලය
(5) වික්‍රමශීලා විශ්වවිද්‍යාලය

46. අශෝක අධිරාජයා බෞද්ධයෙකු වීම පිළිබඳව ඉදිරිපත් වන මතවාද කීපයක් පවතී. ඒ අතරින් "අප්‍රමාදය නිවනට හේතු වේ. - ප්‍රමාදය මරණයට හේතු වේ..." යැයි වදාරණ ලද ධර්මයක් අසා පැහැදී රජු තෙරුවන් සරණ ගිය බව දීපවංශයේ සඳහන් වේ. දීපවංශයට අනුව අශෝක රජුට බෞද්ධයෙකු වීම සඳහා මඟපෙන්වූයේ,

(1) උපගුප්ත තෙරණුවන්
(2) මොග්ගලීපුත්ත තිස්ස හිමියන්
(3) නිග්‍රෝධ සාමණේරයන්
(4) පාර්ශව හිමියන්
(5) වසුමිත්‍ර හිමියන්

47. ප්‍රාග් මහින්ද යුගයේ ආගමක් ලෙස බ්‍රාහ්මණ දහම පැවැතුණි. පණ්ඩුකාභය රජතුමාගේ ගුරුවරයා බ්‍රාහ්මණයෙකු වූ අතර ඔහුගේ නාමය වූයේ,

(1) උපතිස්ස (2) පණ්ඩුල (3) අනුරාධ (4) විජිත (5) වාසෙට්ඨ

48. "මහා විහාර භික්ෂූන්ට දන් දීම තහනම් කරවීය. දන් දෙන අයට කහවණු සියයක දඩයක් නියම කරවීය. සියලුම රාජ්‍ය අනුග්‍රහයන් මහායාන ධර්මයට පක්ෂපාතීත්වයක් දැක්වූ අභයගිරි විහාරයට ලබා දුන්නේ ය. කුසට අහරක් නොමැති වුව ද මහා විහාරීය භික්ෂූන් ථේරවාදී බුදු දහම සුරැකීමට දිවි පරදුවට තබා ක්‍රියා කළේය." මෙම සිදුවීම් හා පාදක වන රාජ්‍ය සමය වන්නේ,

(1) දේවානම් පියතිස්ස (2) කණිට්ඨතිස්ස (3) ගජබා
(4) මහසෙන් (5) IV වන මිහිඳු

49. මහා විහාරය ආරම්භ කර වර්ෂ දෙසිය දාහතක් ගිය කල අභයගිරිය නිර්මාණය වූ බව මහාවංශයේ සඳහන් වේ. අභයගිරිය පෞද්ගලිකව භාරගැනීමත් ගිහියන් සමඟ වැඩි ඇසුර නිසාත් මහා විහාරයේ භික්ෂු පරපුරෙන් පබ්බාජනීය කර්මයට ලක් වූ තෙරණුවන් වන්නේ,

(1) කුපික්කුල මහාතිස්ස හිමි (2) මහදැලියා තිස්ස හිමි
(3) මජ්ඣිම භාණක දේව හිමි (4) බුද්ධ පුත්‍ර හිමි
(5) මහානාග හිමි

50. බුදු සසුන කෙරෙහි පවතින මහත් ශ්‍රද්ධාවත් ගෞරවයත් පදනම් කරගෙන රජවරු ලක්දිව සඟුන්ට සඟ සතුව පූජා කරන ලදී. ලක්රජය නව වරක් ශ්‍රී මහා බෝධීන් වහන්සේටත් මහා සංඝරත්නයටත් පූජා කළ පාලකයා,

(1) දුටුගැමුණු රජුය.
(2) දෙවනපෑතිස් රජුය.
(3) කිත්සිරිමෙවන් රජුය.
(4) II වැනි අග්බෝ රජුය.
(5) I වැනි මුගලන් රජුය.